# 2023.02.14 මහා සභා රැස්වීම් වාර්තාව

## රැස්වීම සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රීවරුන්

01.ප්‍රාදේශීය සභා ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා
02.ප්‍රාදේශීය සභා ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා
03.ප්‍රාදේශීය ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා
04.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා
05.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා
06.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා
07.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය
08.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා
09.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා
10.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා
11.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා
12.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා
13.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා
14.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එන්.ජී.සුනිල් බණ්ඩාර හපුගම්මන මහතා
15.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
16.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා
17.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා
18.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.ඒ.බංඩාරමැණිකා මහත්මිය
19.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය
20.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය
21.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා
22.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය
23.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය
24.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා
25.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා
26.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා
27.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා
28.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා
29.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා

**<u>රැස්වීම සඳහා සහභාගි නොවූ ගරු මන්ත්‍රීවරුන්</u>**
01.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා
02.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා
03.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා
04.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා
05.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා
06.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය
07.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය
08.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා
09.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා

**ආගම සිහි කිරීම.**

ප්‍රථමයෙන් ජාතික ගීය වාදනය, ආගම සිහිකිරීමෙන් අනතුරුව මිය ගිය රණවිරුවන් සිහිකර ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව.10.00 ට පමණ ගරු සභාවේ කටයුතු න්‍යාය පත්‍රානුකූලව ආරම්භ කරන ලදී. 2023 පෙබරවාරි මස මහා සභා රැස්වීමට සහභාගි වන ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මණ්ඩලය ,ලේකම් ඇතුළු කාර්ය මණ්ඩල නිලධාරීන්, මාධ්‍යවේදීන් ඇතුළු සහභාගි වී සිටින සියලු දෙනාට ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරන ලද අතර සියලු දෙනාම ගෞරවයෙන් පිළිගන්නා ලදී.

## 01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.

## I. 2023.01.03 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2023.01.03 දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාවේ අඩුපාඩු ඇත්නම් එය පෙන්වා දෙන ලෙසත්, එසේ නොමැති නම් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කරන ලෙසත් දන්වා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)</u>

2023.01.03 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා - (ශ්‍රී ලං.මු.කො.)</u>

2023.01.03 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ඒ අනුව සංශෝධන නොමැති බැවින් 2023.01.03 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2023.01.03 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## 02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

## I.මාවීඇල -හොරොම්බාව ප්‍රධාන මාර්ගය සම්බන්ධව

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා.</u>

රැස්වීම් රීති 11(8) යටතේ මාවීඇල -හොරොම්බාව මාර්ගය සම්බන්ධව ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා ගරු සභාවට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. එම යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සඳහා යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>

ගරු සභාපතිතුමනි, මාවීඇල -හොරොම්බාව මාර්ගය සම්බන්ධව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්. ජයන්ත හේරත් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

රැස්වීම් රීති 11(8) යටතේ මාවීඇල -හොරොම්බාව මාර්ගය සම්බන්ධව ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා ගරු සභාවට ඉදිරිපත් කර ඇති යෝජනාව විශේෂ යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව රැස්වීම් රීති 11(8) යටතේ මාවීඇල -හොරොම්බාව මාර්ගය සම්බන්ධව ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා ගරු සභාවට ඉදිරිපත් කර ඇති යෝජනාව විශේෂ යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා.**

ඇත්තටම 2018 වසරේ ප්‍රාදේශීය සභාවට තේරී පත් වුණ මන්ත්‍රීවරු අපි. ඉතින් ගරු මන්ත්‍රීතුමන්ලාගේ තුමියන්ලාගේ කාලය අවසන් වීමටත් ළඟයි. මේ වනවිට පළාත් පාලන මැතිවරණයක් ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. එදා මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණෙන් ගරු මන්ත්‍රීවරු 18 දෙනෙකුත් සමඟි ජන බලවේගය හා එක්සත් ජාතික පක්ෂය ඇතුළු ඒ පක්ෂවලින් ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා 11 දෙනෙකුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ප්‍රධාන සන්ධානයේ ගරු මන්ත්‍රීතුමන්ලා 07 දෙනෙකුත් ජනතා විමුක්ති පෙරමුණෙන් ගරු මන්ත්‍රීවරයෙකුත් මුස්ලිම් කොංග්‍රසයෙන් ගරු මන්ත්‍රීවරයෙකුත් තේරී පත්වුණා. පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවේ හිටපු ගරු සභාපතිවරයා විදියට සුනිල් ජයවීර මහතා පත්වුණා.2021 දී ඇතිවුණ කොවිඩ් ආසාධනය වීම නිසා අභාවයට පත්වුණා. ඉන් පසුව ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා ලෙස පත්ව සිටි මා වැඩ බලන සභාපති ලෙස පත් වුණා. දින 40කින් පසුව පළාත් පාලන පනතේ විධිවිධාන යටතේ පක්ෂයේ ලේකම්වරයාට පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයෙකු පත් කිරීමේ බලතල නොමැති නිසා පළාත් පාලන කොමසාරිස්තුමාගේ බලතල යටතේ පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයෙකු තෝරා ගැනීමේ ඡන්දය පැවැත්වුණා. එයට මමත් අමිල නිශාන්ත අරවින්ද ගරු මන්ත්‍රීතුමාත් ඉදිරිපත් වුණා. සාමකාමීව ඡන්දය පවත්වලා පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විදියට මා පත් කර ගත්තා. ඒ සියලුදෙනාට මම මේ අවස්ථාවේදීත් ස්තූතිය පළ කරනවා. පඹුවස්නුවර ප්‍රාදේශීය සභාව අපි ආදර්ශමත් ප්‍රාදේශීය සභාවක් බවට මුළු රටට ම ආදර්ශයක් ගෙනා බව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.විවිධ දේශපාලන පක්ෂ මේ සභාව නියෝජනය කළත් සුහදව ගරු මන්ත්‍රීතුමන්ලාට අසාධාරණයක් නොවන පරිදි කොට්ඨාශ 22 ම ප්‍රාදේශීය සභාවේ සම්පත් යොදාගෙන සංවර්ධන කටයුතු කර ගන්න අවස්ථාව හදලා දුන්නා. සමහර මන්ත්‍රීවරු ඒ ප්‍රතිපාදන ලබා ගත්තේ නෑ. සමහරු පක්ෂ භේදයකින් තොරව තම තමන්ගේ ප්‍රදේශවල වැඩ කටයුතු කළා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමාට දුන්නත් ගත්තේ නෑ. නමුත් ඒ අය කියන්නේ වැඩ කරන්න බලය හා ප්‍රතිපාදන දෙන් නෑ කියලා. නමුත් මම අනිත් අයට වගේම එතුමාටත් ප්‍රතිපාදන ලබා දුන්නා. මහජන නියෝජිතයෙකු විදියට එතුමා ඒ ගැන තැකීමක් නොකළ බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. අනෙක් මන්ත්‍රීවරු අපිට විශාල සහයෝගයක් දුන්නා. පසුගිය වසර එක හමාර තුළ සභාවක් විදියට අපි විශාල ප්‍රගතියක් ලබා ගත්තා. අපි දැවැන්ත කාර්යභාර්යයක් ඉටු කළා. අපි පක්ෂ දේශපාලනෙන් තොරව ස්වාධීන පාලනයක් පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සිදු කළා. මම මෙවර ඡන්දය ඉල්ලන්නෙත් ස්වාධින පක්ෂයකින්. මොකද අපි මහජන නියෝජිතයෝ. ප්‍රාදේශීය සභාවට හෝ පළාත් සභාවට හෝ පාර්ලිමේන්තුවට ගියාට පසුව අපි මහජන නියෝජිතයෝ විදියට නොව පක්ෂ නියෝජිතයෙක් බවට පත් වෙනවා. එහි ප්‍රතිඵල මට ලැබිලා තියෙනවා. මට විවිධ ගැටළු, ප්‍රශ්න, බාධා ආවා. අයවැය පරාජය කරන්න කටයුතු කළා. මට තනතුරු අහිමි කරලා ලිපි ලේඛන ඇවිල්ලා තියෙනවා. ඒ මම මහජන නියෝජිතයෙක් වූ නිසා.පක්ෂ නියෝජිතයෙක් නොවූ නිසා. මම වැඩ කරන්නේ ජනතාවට. ඔබතුමන්ලා දන්නවා බණ්ඩාරකොස්වත්තේ ජල ප්‍රශ්නේ විසඳුවා.විදුලි බලයට විසඳුමක් විදියට අපි හෙට්ටිපොල සතිපොලට සූර්ය බල ශක්තිය මඟින් විදුලිය ලබා දීමට කටයුතු කළා දැන් එය අවසන් අදියරේ තියෙන්නේ. ඒ වගේම සියඹලාගස්වැටිය වැව අපි සංවර්ධනය කළා. හංස බෝට්ටු දෙකක් දාලා එයින් සභාවට ආදායම් මාර්ගයක් හැදුවා. විශාල වියදම් අයින් කරලා සභාවට නව ආදායම් මාර්ග හැදුවා. ආණ්ඩුව දුර්වල වුණත් අපේ ප්‍රාදේශීය සභාව ශක්තිමත්ව තිබුණා. ලක්ෂ 300ක් ජාතික ඉතිරි කිරිමේ බැංකුවට 26.2% පොලියට තැන්පත් කරලා තියෙනවා. මේ තමයි ස්වාධීන පාලනයේ යථාර්ථය. මේ දේවල් කරන්න සියලු පක්ෂ සහයෝගය දුන්නා. මෙවර මැතිවරණයෙන් මේ සභාවට වෙනත් මන්ත්‍රීවරයෙක් සභාපති ධූරයට පත්වෙන්න පුළුවන්. එතුමන්ටත් සභාව හොඳින් කරගෙන යන්න අවශ්‍ය ශක්තිය අපි හදලා තියෙනවා. අපේ කාර්යමණ්ඩලය ගැන විශේෂයෙන්ම සඳහන් කළ යුතුයි.ලේකම් මහතා ඇතුළු මේ කාර්යමණ්ඩලය පුදුම කැපවීමකින් කටයුතු කරන්නේ. මේ නිසාම අපි ලබාගත් ආදායම් ප්‍රතිශතය සියයට සියයයි. පඹුවස්නුවර ප්‍රාදේශීය සභාව විනිවිද භාවයෙන් කටයුතු කරන සභාවක්. මහජනතාවට සාධාරණයක් ඉටු කරන සභාවක්.ඉතින් මහජනතාවත් ඉතාම සුහදව කටයුතු කරනවා.අපි දැවැන්ත කාර්යභාරයයක් සිදු කළ කාල පරිච්ඡේදයක්. මේ සභාව හවුල් සභාවක් විදියට ගෙනියන්න තමා වෙන්නේ කවුරු ඉදිරියේදී පත්වුණත්. ඉතින් මම ඉල්ලීමක් කරනවා අපි හැමෝම සමඟියෙන් කටයුතු කරමු කියලා. ඡන්ද අපේක්ෂක මහත්ම මහත්මීන් ගැටළු ඇති කර ගන්න එපා. ඔබතුමන්ලාගේ වැඩපිළිවෙල ජනතාව අතරට ගෙනියන්න.ජනතාව අපේක්ෂකයා තෝරා පත් කර ගනියි.සභාවට ආවාම බහුතරය නැතිවෙයි. අපි විශාල ජන රැල්ලක් එක්ක මැතිවරණයෙන් ආවේ.පොදුජන එක්සත් පෙරමුණ විදියට අපි එදා කොට්ඨාශ 22 දෙකෙන්

කොට්ඨාශ 18ක් ජයග්‍රහණය කළා.ඉදිරියේ හවුල් සභාවක් පිහිටුවන්න සිදුවෙයි. ඉතින් මේ හිතවත්කම්, මිත්‍රකම් නැතිනොවන ආකාරයට වැඩ කරන්න. මේ මැතිවරණයේදීත් ප්‍රචණ්ඩකාරී නොවන ආකාරයට ගැටුම් ඇති නොවන ආකාරයට ඡන්ද අපේක්ෂක මහත්ම මහත්මීන් අතර ගැටුම් ඇති නොවන ආකාරයට ස්වාධීනව නිදහස් සාමකාමී මැතිවරණයක් සිදු කිරීමට ආදර්ශවත් සභාවක් හැටියට පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව නියෝජනය කරන සියලුම දෙනාගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා විසින් 2023.01.03 දින මහා සභාවේ ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී.

## 03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සංනිවේදන.

### I. නිවාඩු අනුමත කිරීම.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදී මල්ලවආරච්චි මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදී සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.ඒ. බණ්ඩාර මැණිකා මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී.නිමාලි දිල්හානී මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව** ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා වෙත **අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## II. 2023.02.02 දින ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2023.02.02 දින ප්‍රසම්පාදන කමිටුවට සහභාගී නොවූ අයි.ඒ.බණ්ඩාරමැණිකේ වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය - (එ.ජා.ප.)</u>

2023.02.02 දින ප්‍රසම්පාදන කමිටුවට සහභාගී නොවූ අයි.ඒ.බණ්ඩාරමැණිකේ වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්.පයිසර් මහතා - (ශ්‍රී ලං.මු.කො.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2023.02.02 දින ප්‍රසම්පාදන කමිටුවට සහභාගී නොවූ අයි.ඒ.බණ්ඩාරමැණිකේ වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2023.02.02 දින ප්‍රසම්පාදන කමිටුවට සහභාගී නොවූ අයි.ඒ.බණ්ඩාරමැණිකේ වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සහා සම්මත කරන ලදී.**

## III.පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2022.12.31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2022.12.31 දිනට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුමැතිය සඳහා ගරු සභාව වෙත ඉදිරිපත් වී තිබෙනවා.එම භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිළිගැනීමටත්,ඒ සඳහා භාණ්ඩ වෙන්දේසි කිරීම සඳහා තක්සේරු කිරීමට කමිටුවක් හා එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හා භාණ්ඩ වෙන්දේසි කිරීමට කමිටුවක් පත් කිරීමටත් යෝජනා ස්ථිර කරන ලෙස ගරු මන්ත්‍රී මණ්ඩලයට දන්වා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා - (එ.ජ.නි.ස)</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2022.12.31 දිනට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිළිගැනීමත්, භාණ්ඩ වෙන්දේසි කිරීම සඳහා තක්සේරු කිරීමට පහත අයගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමත්,

<u>**භාණ්ඩ තක්සේරු කිරීමේ කමිටුව.**</u>

**01. එච්.ඒ.එම්.අරුණ නිලන්ත මයා, සංවර්ධන නිලධාරී (ආදායම් ප්‍රවර්ධන)**

**02. ඒ.එම්.පී.අයි.කුමාරි මිය,ප්‍රධාන කළමනාකරණ සහකාර**

**03. පී.ඩී.ඩී.එස්.ගුණතිලක මයා,කාර්මික නිලධාරී - කමිටු සාමාජික**

**04. අයි.එම්.එස්.මධුභාෂිණී මිය , ආදායම් පරීක්ෂක**

වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හා භාණ්ඩ වෙන්දේසි කිරීමට පහත අයගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමත් සුදුසු බව මා යෝජනා කරනවා.

<u>**නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ හා භාණ්ඩ වෙන්දේසි කිරීමේ කමිටුව**</u>

**01.ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා**

**02. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා**

**03.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා**

**04.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.සඳනා දිල්හානී ප්‍රනාන්දු මහත්මිය**

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2022.12.31 දිනට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිළිගැනීමත්,භාණ්ඩ වෙන්දේසි කිරීම සඳහා තක්සේරු කිරීමට හා,වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හා භාණ්ඩ වෙන්දේසි කිරීමට ඉහත අයගෙන් සමන්විත කමිටු පත් කිරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2022.12.31 දිනට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිළිගැනීමත්, භාණ්ඩ වෙන්දේසි කිරීම සඳහා තක්සේරු කිරීමට හා,වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හා භාණ්ඩ වෙන්දේසි කිරීමට ඉහත අයගෙන් සමන්විත කමිටු පත් කිරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## IV.ස්ථාවර තැන්පත් ගිණුම් සම්බන්ධව.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

රු.2914465.19ක් වටිනා ගි.අ.144-60-01-00004106-8 දරණ මහජන බැංකු ස්ථාවර තැන්පත් ගිණුම 2023.02.02 දිනට කල් පිරී ඇති බැවින් ලංකා බැංකුවේ වැඩිම පොලී ප්‍රතිශතය වන 24% යටතේ නැවත ආයෝජනය සඳහා සුදුසු බවටත්, යම් හෙයකින් එකී පොලී අනුපාතය මුදල් තැන්පත් කරන දිනය වනවිට වෙනස් වන්නේ නම් අදාළ බැංකුවේම පවතින පොලී අනුපාතය මත මුදල් තැන්පත් කිරීම සුදුසු බවටත් සහා සම්මුතියක් ලබා ගැනීමට යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>

රු.2914465.19ක් වටිනා ගි.අ.144-60-01-00004106-8 දරණ මහජන බැංකු ස්ථාවර තැන්පත් ගිණුම 2023.02.02 දිනට කල් පිරී ඇති බැවින් ලංකා බැංකුවේ වැඩිම පොලී ප්‍රතිශතය වන 24% යටතේ නැවත ආයෝජනය සඳහා සුදුසු බවටත්, යම් හෙයකින් එකී පොලී අනුපාතය මුදල් තැන්පත් කරන දිනය වනවිට වෙනස් වන්නේ නම් අදාළ බැංකුවේම පවතින පොලී අනුපාතය මත මුදල් තැන්පත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

රු.2914465.19ක් වටිනා ගි.අ.144-60-01-00004106-8 දරණ මහජන බැංකු ස්ථාවර තැන්පත් ගිණුම 2023.02.02 දිනට කල් පිරී ඇති බැවින් ලංකා බැංකුවේ වැඩිම පොලී ප්‍රතිශතය වන 24% යටතේ නැවත ආයෝජනය සඳහා සුදුසු බවටත්, යම් හෙයකින් එකී පොලී අනුපාතය මුදල් තැන්පත් කරන දිනය වනවිට වෙනස් වන්නේ නම් අදාළ බැංකුවේම පවතින පොලී අනුපාතය මත මුදල් තැන්පත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව රු.2914465.19ක් වටිනා ගි.අ.144-60-01-00004106-8 දරණ මහජන බැංකු ස්ථාවර තැන්පත් ගිණුම 2023.02.02 දිනට කල් පිරී ඇති බැවින් ලංකා බැංකුවේ වැඩිම පොලී ප්‍රතිශතය වන 24% යටතේ නැවත ආයෝජනය සඳහා සුදුසු බවටත්, යම් හෙයකින් එකී පොලී අනුපාතය මුදල් තැන්පත් කරන දිනය වනවිට වෙනස් වන්නේ නම් අදාළ බැංකුවේම පවතින පොලී අනුපාතය මත මුදල් තැන්පත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

විසිනව ලක්ෂයක ස්ථාවර තැන්පතුව 2023.02.02 දිනට කල් පිරෙනවා. එතකොට අපිට නැවත ආයෝජනය කරන්න වෙන්නේ අනුමැතියෙන් පස්සේ දවසක. ඉතින් අඩුම දින 10ක පොලියක් අහිමිවෙනවා කියලා මට දැනෙනවා.නමුත් එයට කරන්න දෙයකුත් නෑ මම හිතන්නේ. එය අපිට ලොකු පාඩුවක්.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමා, නැවත බැංකුවලින් මිල ගණන් කැඳවලා අපිට ආපසු ලැබෙන්නේත් ඒ බැංකුව නම්, ඉල්ලීමක් කරන්න. ටික කාලයක් දෙන්න කියලා යෝජනාවක් කරන්න.

## V. කඩ කාමර අයිතිය පවරා දීම සම්බන්ධව.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

අංක 216/3,විල්ගොඩ පාර,කුරුණෑගල පදිංචි සින්නයියා යෝගනාදන් යන අය විසින් බදු ලබාගෙන ඇති පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල බස් නැවතුම්පලේ නව වෙළඳ සංකීර්ණයේ අංක G-03 දරණ කඩ කාමරය අංක 318/2, අසනාකොටුව, කුරටිහේන පදිංචි මොහොමඩ් සිද්දික් මොහම්මද් අර්ෂද් යන අය වෙත,කඩ කාමර අයිතිය පවරා දෙන මෙන් සින්නයියා යෝගනාදන් යන අය විසින් ලිපියක් අද දින සභාවට ඉදිරිපත් කර තිබෙනවා.ඒ අනුව අංක G-03 දරණ කඩ කාමරය අංක 318/2, අසනාකොටුව, කුරටිහේන පදිංචි මොහොමඩ් සිද්දික් මොහම්මද් අර්ෂද් යන අය වෙත චක්‍රලේඛන ප්‍රකාරව විධිමත් ගාස්තු අය කර කඩ කාමර අයිතිය පවරාදීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

අංක 216/3,විල්ගොඩ පාර,කුරුණෑගල පදිංචි සින්නයියා යෝගනාදන් යන අය විසින් බදු ලබාගෙන ඇති පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල බස් නැවතුම්පලේ නව වෙළඳ සංකීර්ණයේ අංක G-03 දරණ කඩ කාමරය අංක 318/2, අසනාකොටුව, කුරටිහේන පදිංචි මොහොමඩ් සිද්දික් මොහම්මද් අර්ෂද් යන අය වෙත,කඩ කාමර අයිතිය පවරා දෙන මෙන් සින්නයියා යෝගනාදන් යන අය විසින් ලිපියක් අද දින සභාවට ඉදිරිපත් කර තිබෙනවා.ඒ අනුව අංක G-03 දරණ කඩ කාමරය අංක 318/2, අසනාකොටුව, කුරටිහේන පදිංචි මොහොමඩ් සිද්දික් මොහම්මද් අර්ෂද් යන අය වෙත චක්‍රලේඛන ප්‍රකාරව විධිමත් ගාස්තු අය කර කඩ කාමර අයිතිය පවරාදීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අංක 216/3,විල්ගොඩ පාර,කුරුණෑගල පදිංචි සින්නයියා යෝගනාදන් යන අය විසින් බදු ලබාගෙන ඇති පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල බස් නැවතුම්පලේ නව වෙළඳ සංකීර්ණයේ අංක G-03 දරණ කඩ කාමරය අංක 318/2, අසනාකොටුව, කුරටිහේන පදිංචි මොහොමඩ් සිද්දික් මොහම්මද් අර්ෂද් යන අය වෙත,කඩ කාමර අයිතිය පවරා දෙන මෙන් සින්නයියා යෝගනාදන් යන අය විසින් ලිපියක් අද දින සභාවට ඉදිරිපත් කර තිබෙනවා.ඒ අනුව අංක G-03 දරණ කඩ කාමරය අංක 318/2, අසනාකොටුව, කුරටිහේන පදිංචි මොහොමඩ් සිද්දික් මොහම්මද් අර්ෂද් යන අය වෙත චක්‍රලේඛන ප්‍රකාරව විධිමත් ගාස්තු අය කර කඩ කාමර අයිතිය පවරාදීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## VI. කඩ කාමර අයිතිය පවරා දීම සම්බන්ධව.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල සතිපොල ඉදිරිපිට වෙළඳ සංකීර්ණයේ අංක B-09 දරණ කඩ කාමරය සියඹලාකඩවල,තුත්තිරිපිටිගම පදිංචි කේ.ඒ.චන්ද්‍රජීව මොහන්ලාල් ජයසුන්දර යන අය වෙත පවරා ගැනීමට කැමැත්ත පළ කර ලිපියක් අද දින සභාවට ඉදිරිපත් කර තිබෙනවා.ඒ අනුව අංක B-09 දරණ කඩ කාමරය සියඹලාකඩවල,තුත්තිරිපිටිගම පදිංචි කේ.ඒ.චන්ද්‍රජීව මොහන්ලාල් ජයසුන්දර අය වෙත චක්‍රලේඛන ප්‍රකාරව විධිමත් ගාස්තු අය කර කඩ කාමර අයිතිය පවරාදීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

අංක B-09 දරණ කඩ කාමරය සියඹලාකඩවල,තුත්තිරිපිටිගම පදිංචි කේ.ඒ.චන්ද්‍රජීව මොහන්ලාල් ජයසුන්දර අය වෙත චක්‍රලේඛන ප්‍රකාරව විධිමත් ගාස්තු අය කර කඩ කාමර අයිතිය පවරාදීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අංක අංක B-09 දරණ කඩ කාමරය සියඹලාකඩවල,තුත්තිරිපිටිගම පදිංචි කේ.ඒ.චන්ද්‍රජීව මොහන්ලාල් ජයසුන්දර අය වෙත චක්‍රලේඛන ප්‍රකාරව විධිමත් ගාස්තු අය කර කඩ කාමර අයිතිය පවරාදීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## 04.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

## 05.යථා පරිදි කල් දී ඇති යෝජනා-

## I.මාවීඇල -හොරොම්බාව ප්‍රධාන මාර්ගය සම්බන්ධව

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

රැස්වීම් රීති 11(8) යටතේ මාවීඇල -හොරොම්බාව මාර්ගය සම්බන්ධව ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා ගරු සභාවට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. එම යෝජනාව විශේෂ යෝජනා යටතේ ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙනවා.

**<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>**

ගරු සභාපතිතුමනි, හදිසි යෝජනාවක් විදියට මෙය සභාවට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන ස්තූතිවන්ත වෙනවා.කොටඹපිටිය සිට හොරොම්බාව දක්වා මාර්ගය පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මැදින් ගමන් ගන්නා ප්‍රධාන මාර්ගයක්, පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් බී ශ්‍රේණියේ මාර්ගයක්.පුද්ගලික අංශයේ බස් රථ 14ක් හා ගමනා ගමන මණ්ඩලයේ බස් රථ තුනක් හෝ හතරක් ධාවනය වුන ප්‍රධාන මාර්ගයක්.නමුත් දැන් මේ මාර්ගයේ කොටසක් ධාවනයට නොසුදුසු තත්ත්වයේ තියෙන්නේ. ඒ හේතුවෙන් පුද්ගලික බස් රථ 14ක් ධාවනය වුණ මාර්ගයේ දැන් බස් රථ 02ක් දක්වා අඩුවෙලා. හේතුව හොරොම්බාව සිට හිඳව දක්වා කොටස කාපට් අතුරා සංවර්ධනය කරලා තියෙනවා.කොටඹපිටියේ සිට උඩුගම්පලගෙදර විහාරස්ථානය දක්වා කොටස සංවර්ධනය කරලා තියෙනවා. මැද්දේ කි.මී.1.8ක කොටසක් බොහෝම අබලන් තත්ත්වයේ තියෙනවා. අඩුම තරමේ පාපැදියකටවත් යා නොහැකි තත්ත්වයේ තියෙන්නේ මේ කොටස. ඒ නිසා තමා මේ බස් රථ ධාවනයෙන් ඉවත්වෙලා තියෙන්නේ. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරලා මේ මාර්ගය ධාවනයට සුදුසු පරිදි කාපට් දමා හෝ තාර දමා හෝ නඩත්තු කටයුත්තක් සිදු කර හෝ දෙන්න කියලා ගරු සභාවෙන් මම යෝජනා කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු උප සභාපතිතුමා කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කළේ . අතිශයින්ම දුෂ්කර මාර්ගයක් උඩුගම්පලගෙදර සිට හිඳව දක්වා මාර්ගය.ඇත්තටම අපි දීර්ඝ කාලයක් අපේක්ෂාවෙන් සිටියා මේ මාර්ගය පිළිසකර කරයි කියලා. මේ මාර්ගය ප්‍රදේශයේ අත්‍යවශ්‍යම මාර්ගයක්.හලාවත- කුරුණෑගල ප්‍රධාන පාරටත්, කුලියාපිටිය- නාරම්මල ප්‍රධාන පාරටත් සම්බන්ධවන අතුරු මාර්ගයක්. විශාල ජනගහණයක් මේ පාර ප්‍රයෝජනයට ගන්නවා. මේ කාරණය සම්බන්ධව මමත් එකඟ වෙනවා උප සභාපතිතුමාත් එක්ක මේ දක්වා මේ මාර්ගය ගැන අවධානය යොමු නොකිරීම ගැන. අවස්ථා කිහිපයකදීම මේ ගරු සභාවෙත් කතා කරලා තියෙනවා. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදීත් මේ සම්බන්ධව කතා කරලා තියෙනවා. මාධ්‍යවේදීන් පත්තරවල සඳහන් කරලා තිබුණා. නමුත් අදාල බලධාරීන් මේ සම්බන්ධව කිසිම අවධානයක් යොමු කළේ නෑ.කුරුණෑගල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා හිටියේ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගුණපාල රත්නසේකර මැතිතුමා. මම හිතන්නේ එතුමාත් මේ සම්බන්ධව කිසිම අවධානයක් යොමු කළේ නෑ. මහා මාර්ග ඇමතිතුමා ජෝන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා. එතුමාත් කිසිවක් කළේ නෑ. මේ කිසිම කෙනෙක් මේ කි.මී. 1.8ක සුළු කොටස ගැන අවධානය යොමු කරලා නෑ. මේ වගේ තවත් මාර්ග නැතුවා නෙවෙයි.නමුත් පඩුවස්නුවර තියෙන ප්‍රධාන මාර්ගයක් මේ තත්ත්වයට පත්වීම පිළිබඳව අතිශයින්ම කණගාටුදායකයි. ඒ වගේම නෙලිබෑව පාර, මොරගනේ පාරවල් වැනි තවත් මාර්ග කිහිපයක දැවැන්ත බෝර්ඩ් දාලා මුල් ගල් තියලා ගියා. මේ නිසා ජනතාව දැඩි අපහසුතාවයට පත්වුණා. ඒ විදියට නොකර තිබුණානම් අපිට ප්‍රාදේශීය සභාවෙන් පාරවල් හදන්න තිබුණා. ජී.සී.බී. යන්ත්‍ර දාලා පාරවල් තුනී කරලා,දැන් ජනතාව අපෙන් ඉල්ලනවා මේ පාරවල් ටික හදලා දෙන්න කියලා. ගිවිසුම් අත්සන් කළ කොන්ත්‍රාත්කරුවෝ ඉන්නවා. අපිට තනි තීරණ ගන්න බෑ. එහෙම වුණොත් අධිභාරයන් පවා සිදුවෙන්න පුළුවන්, කොන්ත්‍රාත්කරුවන්ගේ ඒවාට ඇයි අපි මැදිහත් වුණේ කියලා. ඒ කොන්ත්‍රාත්කරුවන් අපිට නඩු දාන්නත් පුළුවන්, ඒ මිනිසුන්ගේ ගල්, බොරළු අපි අරන් ගියා කියලා. මේ කාරණා නිසා අපහසුතාවයට පත්වෙන්නේ මහජනතාව. මේ පිළිබඳව අවධානය යොමු කළ යුතු සියළුදෙනාම දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමු.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>**

ගරු සභාපතිතුමනි, ඒ කොන්ත්‍රාත්කරුවන් ඒ පාරවල් හදනවා කියලා තියෙනවාද?එහෙම නැද්ද?

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)**

ගරු සභාපතිතුමනි, ගරු උප සභාපතිතුමාත් කාලෝචිත යෝජනාවක් ගරු සභාවට ඉදිරිපත් කළේ. මාවීඇල ඒ කොටසේ අබලන් තත්ත්වයේ තියෙනවා, සංවර්ධනය නොකළ විශාල කොටසක්.ඒ වගේම අයි රෝඩ් (i –ROAD) ව්‍යාපෘතිය යටතේත් යෝජනා වුණා පඩුවස්නුවර රජමහා විහාරය හරහා රත්මුළුකන්ද දක්වා මාර්ගය. ඒ මාර්ගයේත් කොටසක් වැඩ අවසන් කරලා නමුත් තව පඩුවස්නුවර රජමහා විහාරයට යන කොටස අබලන් තත්ත්වයේ තියෙනවා. . ඒ මාර්ගය සංවර්ධනය කිරීමේ දී පුරාවිද්‍යා සම්පත්වලට හානි වෙයි කියලා ඒ කොටස සංවර්ධනය කළේ නෑ. නමුත් ඒ කොටස සංවර්ධනය කළ යුතුම කොටසක්. මොකද පඩුවස්නුවර රාජධානිය නරඹන්න පිරිස එන්නේ මේ මාර්ගවල. වගකිව යුතු සියලුදෙනා දැනුවත් කළත් වෙනසක් වුණේ නෑ. දයාසිරි ජයසේකර මැතිතුමාගේ කාලේ මුදල් වෙන් කරලා තමා අයි රෝඩ් (i –ROAD) ව්‍යාපෘතිය පටන් ගත්තේ. මේ පාරවල්වල කොටසක් හැදෙනවා. කොටසක් හැදෙන්නෑ. නමුත් මුදල් ආපසු ගිහිල්ලත් නෑ. විශේෂයෙන්ම මාවීඇල මාර්ගය ගැන සඳහන් කරනකොට, කොටසක් නිම කර තිබෙන මේ අයි රෝඩ් (i –ROAD) ව්‍යාපෘතියේ මේ මාර්ගය පිළිබඳවත් සටහන් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.මොකද ප්‍රාදේශීය සභාව හරහා හෝ මේ මාර්ග සංවර්ධනය කරන්න ක්‍රමවේදයක් හදන්න පුළුවන් වේවි. කොට්ඨාශයේ ජනතාව මැසිවිලි නඟනවා කොටසක් හදලා කොටසක් වැඩ අවසන් කරලා නෑ කියලා. ඒ නිසා මේ ගැනත් අවධානය යොමු කරන්න කියලා විශේෂයෙන්ම මතක් කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා - (එ.ජ.නි.ස.)**

ගරු සභාපතිතුමනි, මේ ගෙනාව යෝජනාව වගේම මාවිඇල හංදියේ සිට නඟුල්මුන්න දක්වා අයි රෝඩ් (i –ROAD) ව්‍යාපෘතිය හරහා හදපු මාර්ගයේ කොස්දෙණිය විහාරස්ථානය ආසන්න වෙල්යාය මැද බෝක්කු කොටස කාපට් අතුරා තිබෙනවා.නමුත් බෝක්කුව ගිලා බැසලා තියෙන්නේ. අපි ඒ ගැන පුද්ගලිකව දැනුවත් කළා. නමුත් මෙය පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පාරක්. මේ වනතුරු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරීන් ඇවිත් මේ ගැන සොයා බැලීමක් කරලා අවශ්‍ය විසඳුමක් දීලා නෑ.මෙයත් අයි රෝඩ් (i –ROAD) ව්‍යාපෘතිය හරහා හදපු ප්‍රධාන මාර්ගයක්. මෙතැන යම් අනතුරක් සිදුවිය හැකි ස්ථානයක්.ඒ නිසා මේ ගැනත් හොයා බලන්න. ඒ වගේම දෙමළදොර මාර්ගය බාගයක් සංවර්ධනය කරලා තියෙන්නේ.මේවා ගැන මහජන නියෝජිතයෝ විදියට අපෙන් මහජනතාව ප්‍රශ්න කරනවා. මේ සංවර්ධනය කළයුතු තැන් ගැන අවධානය යොමු කරලා මේවාට ගතයුතු පිළියම් මොනවාද කියලා සභාවෙන් සොයා බලන්න.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා - (එ.ජ.නි.ස.)**

